1 3 SEP 2017
වාරිමාර්ග කළමනාකරණ

## නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මුරුතවෙල
## வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் – முறதவெல
## Resident Project Management Office – Muruthawela

**වාරිමාර්ග කළමනාකරණ අංශය**
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

වීරකැටිය
வறகாட்டிய
Weraketiya

මගේ අංකය / எனது இல / My Ref No – 23/3/28
ඔබේ අංකය / உமது இல / Your Ref No –
දිනය / திகதி / Date – 2017.08.

<u>ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම අගෝස්තු මාසය</u>
<u>මුරුතවෙල ව්‍යාපාරය</u>
දිනය - 2017.08.01
ස්ථානය - මුරුතවෙල නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය
වේලාව - පෙ.ව. 9.30
<u>සහභාගිත්වය</u>
<u>රාජ්‍ය නිලධාරීන්</u>

01. කේ.ජයසිංහ මහතා - නේවාසික ව්‍යාපාර කළමනාකරු
02. එස්.ටී.එස්. චාන්දනී මිය - ආයතන සංවර්ධන නිලධාරී - මුරුතවෙල ව්‍යාපාරය
03. ඩබ්ලිව්.ජී.ජී.එන්. ලක්මාලි මිය - සංවර්ධන නිලධාරි- මුරුතවෙල ව්‍යාපාරය
04. ජේ.එස්.ඩෙල්කාන්ති මිය - සංවර්ධන නිලධාරි- මුරුතවෙල ව්‍යාපාරය
05. ඊ.ජී.ජී සංජීවනී මිය - සංවර්ධන නිලධාරි - මුරුතවෙල ව්‍යාපාරය
06. කේ.ටී. බන්දුසිරි මහතා - ඉංජිනේරු සහකාර - වාරි.කා.වීරකැටිය
07. ආර්.පී.සී.කුලරත්න මිය - ඉංජිනේරු සහකාර - වාරි.කා.වීරකැටිය
08. ටී.පී.එම්. පඩිප්පෙරුම මයා - ඉංජිනේරු සහකාර - වාරි.කා.වීරකැටිය
09. එම්.සී.පී. කුමාර මයා - සංවර්ධන නිලධාරි - වාරි.කා.වීරකැටිය

<u>ගොවි සංවිධාන නියෝජිත මහතුන්</u>

1. ඒ.එම්.කේ. ගුණසේන මයා - යාය 01 වීර 01 සභාපති
2. කේ.කේ. ලක්ෂිත කොඩිකාර මයා - යාය 01 රුහුණු සභාපති
3. විජේරත්න කළුආරච්චි මයා - යාය01 උළුකපුහේන භාණ්ඩාගාරික
4. ජයසේන විදානපතිරණ මයා - යාය 01 වීර 02 ලේකම්
5. එස්.අලහප්පෙරුම මයා - යාය 01 සියඹපහැද්දැව ලේකම්
6. පියදාස විජේසිංහ මයා - යාය 01 සියඹලහැද්දැව සභාපති
7. ජී.කේ. සම්පත් මයා - යාය 01 ප්‍රගති සභාපති
8. කේ. එදිරිබන්දු මයා - යාය 02 ඩී 01 ඉහළ භාණ්ඩාගාරික
9. එම්. දයාසිරි මයා - යාය 02 ඩී 01 ඉහළ සභාපති

10.ඩබ්.ඒ. පියදාස මයා - යාය 02 ඩී 01 පහල ලේකම්
11. ඕ.ඒ. පියසේන මයා - යාය 02 ඩී 04 සභාපති
12. ටී. ජයතිස්ස මයා - යාය 02 ඩී 05 සභාපති
13. එම්.ඒ. කුමාරසිරි මයා - යාය 02 ඩී 06 ලේකම්
14.ජී. සයිමන් මයා - යාය 02 ඩී 07 සභාපති
15. කේ. අමරසේන මයා - යාය 02 ඩී 07 ලේකම්
16. එම්.ඩී පියදාස මයා - යාය 02 ඩී 09 සභාපති
17.ඩබ්ලිව්.ඒ. චන්ද්‍රසිරි මයා - යාය 03 ඩී 01 සභාපති
18.එම්.පියදාස මයා - යාය 03 ඩී 01 ලේකම්
19. බී.කේ. ගාමිණී මයා - යාය 03 ඩී 02 භාණ්ඩාගාරික
20. එම්.එස්. සුමිත් මයා - යාය 03 ඩී 03 භාණ්ඩාගාරික
21. උපසේන අමරවීර මයා - යාය 03 ඩී 04 භාණ්ඩාගාරික
22. වී.ජී. විජේදාස මයා - යාය 03 ඩී 04 සභාපති
23කේ.කේ. චන්දන උදයංග මයා - යාය 03 ඩී 05 සභාපති
24. ඩබ්ලිව්. පී. අමරසේන මයා - යාය 03 ඩී 08 සභාපති
25. ඩබ්ලිව්.එල්.වීරසිංහ මයා - යාය 03 ඩී 08 ලේකම්
26. ටී.කේ. ආරියදාස මයා - යාය 03 ඩී 08 භාණ්ඩාගාරික
27.වයි.ඒ.පියදාස මයා - යාය 03 ඩී 08 ජල පාලක
28. ටී.කේ. ආරියදාස මයා - යාය 03 ඩී 08 භාණ්ඩාගාරික
29. ජී.ජී. ප්‍රේමතිලක මයා - යාය 03 ඩී 09 සභාපති

න්‍යාය පත්‍රානුකූලව ආගම සිහිකිරීමෙන් අනතුරුව නේ.වා.කළ. විසින් පැමිණ සිටි පිරිස පිලිගන්නා ලදී. අනතුරුව පසුගිය වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදි. අඩුපාඩු කිසිවක් නොවූයෙන් වාර්ථාව සභා සම්මත විය.

<u>ආයතන සංවර්ධන කටයුතු - ආයතන සංවර්ධන නිලධාරී (එච්.ටී.එස්. වාන්දනී මිය).</u>

<u>ගොවි සංවිධාන නිලවරණ කටයුතු</u>

- 2017 වර්ෂයේ පැවැත්වීමට නියමිත නිලවරණ සියල්ල පවත්වා අවසන් කර ඇති අතර ගොවි සංවිධාන සියල්ලම විගණනයද අවසන් කර ඇත.ගොවි සංවිධාන 22ක මහා රැස්වීම් පවත්වා ඇති අතර අගෝස්තු මාසයතුල පහත පරිදි මහා සභා රැස්වීම් පැවැත්වීමට නියමිතය.

| ගොවි සංවිධානයේ නම | මහා සභා රැස්වීම් පැවැත්වීමට අපේක්ෂිත දිනය |
|---|---|
| යාය 03 ඩී 09 | 2017.08.08 |
| යාය 03 ඩී 05 | 2017.08.11 |
| යාය 02 ඩී 09 | 2017.08.15 |
| යාය 02 ඩී 04 | 2017.08.17 |

<u>පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>

- මූල්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහන් 03 ක් සහ නිරන්තර නඩත්තු වැඩසටහන් 03ක් සඳහා ප්‍රතිපාදන ලැබී ඇති අතර යාය 02 මූල්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහන 2017.07.27 දින පැවැත්විය.යාය 03 මූල්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහන 2017.08.17 ඩී 08 ප්‍රජා ශාලාවේදීත් යාය 01 පුහුණු වැඩසටහන 2017.08.24 දින මීගස්ආර ප්‍රජාශාලාවේ පැවැත්වීමට සැලසුම් කර ඇත.

යාය I,II,III වී වගා කර ඇති බැවින් මෙම කාලය තුල ගොවි සංවිධාන කාලසටහනකට අනුව ජලය බෙදා ගැනීම සඳහා ක්‍රියාකාරී දායකත්වයකින් යුතුව කටයුතු කල යුතු බවත් ගොවි සංවිධාන නිලධාරී මණ්ඩලය සහ ගොවි මහතුන් කැපවීමකින් ක්‍රියාකල යුතු බවත් පැවසීය.

වාරිමාර්ග කටයුතු - ( වාරිමාර්ග ඉංජිනේරු සහකාර - කේ.ටී. බන්දුසිරි මහතා )

මුරුතවෙල ජලාශයේ ජල තත්වය අක්කර අඩි 20350ක් බවත් 2017 යල කන්නය ආරම්භ කරනවිට මුරුතවෙල ජලාශයේ අක්කර අඩි 33000ක් පැවැති බවද පැවසීය.දැනට දිනකට අක්කර අඩි 290 නිකුත් කරන බවත් ඔක්තෝබර් 21 දින වන තෙක් තවත් දින 77ක් ජලය නිකුත් කල යුතු බවත්, ජලාශයේ තිබෙන ජල ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගතහැකි ධාරිතාවය අක්කර අඩි 16000ක් බැවින් කන්නය අවසන් කිරීමට අක්කර අඩි 8000ක පමණ ජල හිගයක් පවතින බැවින් මනා ජල කළමනාකරණයක් කල යුතු බවත් ගොවි සංවිධාන සක්‍රියව ජලය බෙදා ගැනීම සදහා දායක වියයුතු බවද තවදුරටත් පවසන ලදී.ගොවි සංවිධානවල ජල පාලකවරුන්ගේ නම් සහ දුරකථන අංක ඉදිරි දින තුන ඇතුලත ලබාදෙන ලෙස ඉල්ලීය.

ජලමුර ලබාදීමේ කාලසටහන

| | |
|---|---|
| යාය 01 කොටසට | - සිකුරාදා සහ සෙනසුරාදා |
| යාය 02 ඩී 01 | - බ්‍රහස්පතින්දා, සිකුරාදා සහ සෙනසුරාදා |
| යාය 02 ඩී 08 සහ 09 | - බ්‍රහස්පතින්දා සහ සිකුරාදා |
| යාය 03 කොටසට | - සදුදා, අගහරුවාදා සහ බදාදා |

යාය 03 ඩී 09 ගොවි සංවිධානයේ සභාපති - ජී.ජී. ප්‍රේමතිලක මයා

තම ගොවි සංවිධාන බල ප්‍රදේශයේ 90% වපුරා අවසන් බවත් අක්කර 7ක ප්‍රමාණයක් වගා කිරීමට ජලය ලබාගැනීමට නොහැකි බවද පැවසීය.FC 124 ඇලෙහි ජලයෙන් ගෙයක් යටවන බවත් මේ පිලිබදව සොයා බලන ලෙසත් D 9 ඇලෙහි අග කොටස ශුද්ධ කිරීම සදහා JCB යන්ත්‍රය ලබාදෙන ලෙසත් ඉල්ලීය.

ඉංජිනේරු සහකාර කේ.ටී. බන්දුසිරි මහතා JCB යන්ත්‍රය ලබාදීමට එකග විය.

යාය 03 ඩී 08 ගොවි සංවිධානයේ ලේකම් - ඩබ්ලිව්.එල්.වීරසිංහ මයා

FC 104 , 105, 106 ඇලවල් සදහා ජලය නොලැබීම නිසා වගා කිරීමට නොහැකි බව පැවසීය.ජලය ප්‍රමාණවත් නොවීමට හේතුව අනවසර බට වලින් ජලය ලබා ගැනීම බවත් එලෙස බට ඇති ස්ථාන පිලිබද ලිඛිතව තොරතුරු ලබාදිය හැකි බවද පැවසීය.

ඊට පිලිතුරු දෙමින් ඉංජිනේරු සහකාරතුමා එලෙස අනවසර බට නොමැති බව ප්‍රකාශ කර සිටියේය.

යාය 03 ඩී 08 ගොවි සංවිධානයේ සභාපති - ඩබ්ලිව්. පී. අමරසේන මයා

වාරිමාර්ග පද්ධතියේ පවතින අඩුපාඩු පෙන්වා දී ඇතත් මෙතෙක් ඒවා සකස් කර දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් පැවසීය.

අද දිනෙන් පසු අනවසරයෙන් ජලය ලබා ගතහොත් ඇල කොන්ක්‍රීට් කිරීම සුදුසු බවත් අලාශය ගොවි සංවිධානයේ සාමාජිකයන්ගෙන් අයකර ගැනීම කල යුතු බවත් යාය 03 ඩී 08 ඩබ්ලිව්.එල්.වීරසිංහ මහතා යෝජනා කල අතර ව්‍යාපාර කමිටුව ඒකමතිකව ස්ථිර කරන ලදී.

ඉංජිනේරු සහකාර - කේ.ටී. බන්දුසිරි මහතා

ඊලග ව්‍යාපාර කම්ටුවට පෙර අනවසර බට ඉවත් කිරිමට එකග විය.යාය 01 සදහා නඩත්තු කම්කරුවන් දෙදෙනෙක්, යාය 02 සදහා නඩත්තු කම්කරුවන් තිදෙනෙක්, යාය 03 සදහා ස්ථිර නඩත්තු කම්කරුවෙක් සහ තාවකාලික කම්කරුවෙක් වශයෙන්ද සේවයේ යොදවා ඇති බව පැවසිය.යාය 03 ඩී 08 ගොවි සංවිධානයේ 104, 105 සහ 106 ඇලවල්වල වගා කිරිමට නොහැකි වූ ඉඩම් වගා නොකිරිම සුදුසු බවත් ඊලග ජල මුරයේ සිට ජලමුර ක්‍රමය ක්‍රියාත්මක කරන බවද පවසා සිටියේය.

යාය 03 ඩී 09 ගොවි සංවිධානයේ සභාපති - ජී.ජී. ප්‍රේමතිලක මයා

යාය 03 කොටසේ ගේට්ටු දමා දෙන ලෙසත් යාය 03 FC 66 ප්‍රශ්නය විසදීමට කොන්ක්‍රීට් කට්ටියක් ගැසීම සුදුසු බව යෝජනා කර සිටියේය.තවද ඩී 04 බටය සෑදීම අවශ්‍ය බවද පවසා සිටියේය.

යාය 03 ඩී 01 ගොවි සංවිධානයේ ලේකම් - එම්.පියදාස මයා

තම බල ප්‍රදේශයේ නිවසක් වාරි ජලයෙන් යටවන බැවින් ඒ පිලිබදව අවධානය යොමු කරන ලෙස ඉල්ලීය.තවද වගා බිමට ගවයින් දැම්ම නිසා වගාවට මෙන්ම ඇල පද්ධතියටද හානි සිදුවීම මෙන්ම ගොවීන්ටද මරණිය තර්ජනද ගව හිමියන්ගෙන් එල්ල වන බවද පැවසිය.

නේවාසික ව්‍යාපෘති කළමනාකරු - කේ.ජයසිංහ මහතා

ගොවි සංවිධානවල කාරක සභා රැස්වීම් පවත්වා ජල මුර කාලසටහනක් සකස් කර ගන්නා ලෙස පැවසිය.තවද ගව හිමියන් කැදවා දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉදිරියේදී පවත්වන බවත් ප්‍රදේශයේ සිටින ගවහිමියන්ගේ නම් සහ ලිපිනයන් ඉදිරි දින 03 ඇතුලත ලබාදෙන මෙන් ඉල්ලීය.

යාය 02 ඩී 09 ගොවි සංවිධානයේ සභාපති - එම්.ඩී. පියදාස මයා

තම ගොවි සංවිධාන බල ප්‍රදේශයේ කැඩී තිබූ ගේට්ටු දෙකක් සංවිධානයේ වියදමින් සකස් කර ගත් බවත් ජලය බෙදා ගැනීමේ කාලසටහනක් සකස් කර ගන්නා බවත් පවසා සිටියේය.

යාය 02 ඩී 09 ගොවි සංවිධානයේ සභාපති -ජී. සයිමන් මයා

තම ගොවි සංවිධානයේ ජලය බෙදා ගැනීමේ ගැටළුවක් නොමැති බව පැවසිය.

යාය 02 ඩී 06 ගොවි සංවිධානයේ ලේකම් - එම්.ඒ. කුමාරසිරි මයා

FC 68, 69 ඇලවල්වල ගැටළුකාරී තත්වයක් පවතින බවත් අක්කර පහක පමණ ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම වගා කිරිමට නොහැකි වී ඇති බව පැවසිය.

යාය 02 ඩී 09 ගොවි සංවිධානයේ සභාපති - ටී. ජයතිස්ස මයා

FC 57 ඇලේ අවසන් කොටස කොන්ක්‍රීට් කරදෙන ලෙසත් FC 6 ඇලේ ජලය අපතේ යන බවත් පවසා සිටියේය.ගොවි සංවිධානයේ පිරිත් පිංකම අගෝස්තු 09 දින පවත්වන බැවින් සියලුමදෙනාට සහභාගී වන මෙන් ඉල්ලා සිටියේය.

යාය 02 ඩී 01 ඉහළ ගොවි සංවිධානයේ FC 1,2,3 සහ 4 ඇලවල් වල පවතින ගැටළු ගොවි නියෝජිතයින් විසින් ඉදිරිපත් කරන ලදී. FC 3 අමතර බටයක් ලබාදෙන ලෙසත් FC 4 දමා ඇති බටය ඉවත් කරදෙන ලෙසත් ඉල්ලීය.

ඉංජිනේරු සහකාර - කේ.ටී. බන්දුසිරි මහතා

ගමතෙක් හිතුමතේට ජලය ලබාගත් ගොවීන් කාලසටහනකට අනුව ජලය ලබාගැනීමට මැලිකමක් දැක්වීම මෙම ගැටළුවට හේතුව බව පැවසීය.ඊලග ජල මුරය අවසාන දිනයේ එම ස්ථානයට ගොස් ක්ෂේත්‍ර පරීක්ෂාවක් කිරීමට එකග විය.

යාය 01 සියඹලහැද්දැව ගොවි සංවිධානයේ ලේකම් - එස්. අලහප්පෙරුම මයා

ගොවි සංවිධානයේ මුදලින් ඉබි යතුරු මිලට ගෙන යාය 01 කොටසේ ගේට්ටුවලට දැමීම තුලින් ජලය අපතේ යාම වැලැක්වීමට ගත් ක්‍රියාමාර්ග ඉතා සාර්ථක බවත්, ඩී 02 ඇලේ ජලය හැරවීමට අපහසු බැවින් තව පැය 12ක් එම ඇලට පමණක් ජලය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටියේය.තවද ඉතිරි ගේට්ටුවලට ඉබි යතුරු දමා දෙන ලෙසත් , ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම සුදුසු බවත් පවසා සිටියේය.

යාය 01 උළුකපුහේන ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික - විජේරත්න කළුආරච්චි මයා

යාය 01 කොටසේ දමා ඇති ඉබි යතුරු වලට හානි කලහොත් රු 5000 ක දඩයක් සහ අවුරුද්දක පොහොර සහනාධාරය අත්හිටුවීම කල යුතු බව යෝජනා කර සිටියේය.

ව්‍යාපාර කමිටුව එම යෝජනාව ස්ථිර කරන ලදී.

ව්‍යාපාර කමිටු ලේකම්වරයාගේ ස්තුති කථාවෙන් පසුව සභාවේ වැඩ කටයුතු නිම විය.

..............................................
කේ.ජයසිංහ,
නේවාසික ව්‍යාපෘති කළමනාකාර,
මුරුතවෙල මහා වාරිමාර්ග ව්‍යාපාරය.

..............
වී.ජයතිස්ස,
ලේකම්.

පිටපත්
අධ්‍යක්ෂ/ වාරිමාර්ග කලමනාකරණ අංශය - කා.දැ.ස.

wel